# භූගෝල විද්‍යාව

11 ශ්‍රේණිය

# ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විධිමත් දත්ත එකතු කරනු ලබන්නේ **ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව** මගිනි.
- ලංකාවේ පළමු ජන සංගණනය **1871** දී පවත්වා තිබේ.
- එතැන් සිට සෑම වසර **10**කට වරක්ම ජන හා නිවාස සංගණන පවත්වා තිබේ.
- ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වුව ද ජන සංඛ්‍යාවේ ඇතැම් ගුණාත්මක දත්ත අනුව සංවර්ධිත ලක්ෂණ පෙන්වයි.
- එනම්, ළදරු මරණ අනුපාතය, මාතෘ මරණ අනුපාතය, ආයු අපේක්ෂාව, සාක්ෂරතාව වැනි ගුණාත්මක ලක්ෂණ සංවර්ධිත රටක ලක්ෂණ පෙන්වයි.

# ජන සංඛ්‍යාවේ විශාලත්වය

- 2012 වන විට ලංකාවේ ජන සංඛ්‍යාව මිලියන 20.2ක් පමණ විය.
- සාමාන්‍ය ජන ඝනත්වය වර්ග කිලෝමීටරයකට 323 දෙනෙකි.
- දකුණු ආසියානු රටවල් සමග සැසඳීමේ දී වාර්ෂික වර්ධන වේගය අඩුම රට වන්නේ ශ්‍රී ලංකාවයි.

4.1 වගුව - දකුණු ආසියාතික රටවල ජනසංඛ්‍යාව, ජන ඝනත්වය සහ සාමාන්‍ය වාර්ෂික වර්ධනය - 2013

| රට | ජනසංඛ්‍යාව (මිලියන) | ජන ඝනත්වය 1km² ට | සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය |
|---|---|---|---|
| ඉන්දියාව | 1,252 | 381 | 1.3 |
| පකිස්ථානය | 182 | 229 | 1.8 |
| බංග්ලාදේශය | 156 | 1087 | 1.1 |
| නේපාලය | 27 | 189 | 1.2 |
| **ශ්‍රී ලංකාව** | **21** | **324** | **0.8** |
| භූතානය | 0.75 | 16 | 1.9 |
| මාලදිවයින | 0.34 | 1158 | 1.8 |

මූලාශ්‍රය : *un Population chart, 2013, www.unpoulation.org* 2015-07-03.

# ජන සංඛ්‍යා වර්ධනය

- ජන සංඛ්‍යා වර්ධනය යනු යම් නිශ්චිත භූමි ප්‍රමාණයක සිටින ජන සංඛ්‍යාව වැඩි වීම යි.
- 1871 දී ජන සංඛ්‍යාව මිලියන 2.4ක් වූ අතර 2012 වන විට එය මිලියන 20.2ක් බවට පත්ව තිබේ.
- 1871 සිට මේ දක්වාම නොකඩවා ජන සංඛ්‍යාව වර්ධනය වී ඇත.
- 1946 දක්වා මේ වර්ධනය ඉතා සෙමෙන් සිදු වී තිබේ.
- ඉහළම වර්ධන අනුපාතිකය වූ 2.8, 1946-1953 අතර කාලයේ දී වාර්තා වී ඇත.
- 1953න් පසු වර්ධන වේගය ක්‍රමයෙන් අඩු වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.
- 2012 වර්ෂයේ දී වර්ධන වේගය 0.7 දක්වා අඩු වී තිබේ.




4.1 ප්‍රස්තාරය - සංගණන වර්ෂ අනුව සංඛ්‍යාවේ වර්ධනය





4.2 ප්‍රස්තාරය - ජනසංඛ්‍යාවේ වාර්ෂික වර්ධන අනුපාතිකය

# ජන සංඛ්‍යා වර්ධන වේගයේ ප්‍රාදේශීය වෙනස්කම්

- ලංකාවේ වාර්ෂික වර්ධන වේගය 0.7%කි.
- නමුත් බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ එය 1.23%ක් ලෙස ද ගම්පහ දිස්ත්‍රික්කයේ 1.02%ක් ලෙස ද වැඩි වර්ධන වේගයක් පෙන්නුම් කරයි.
- ඊට හේතුව කොළඹට ආසන්න වීම හා ජන සංක්‍රමණ යන කරුණු යි.
- මෙය නුවරඑළිය දිස්ත්‍රික්කයේ 0.05% ක් තරම් අඩු වන අතර බදුල්ල දිස්ත්‍රික්කයේ 0.39% ක් ද කොළඹ දිස්ත්‍රික්කයේ 0.35%ක් ද වේ.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉහළම වර්ධන වේගයක් පෙන්නුම් කරන අතර එය 1.33%කි.


# ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය

- ලංකාවේ ජනගහණය වැඩිම පළාත බස්නාහිර පළාත වේ.
- ජනගහණය අඩුම පළාත උතුරු පළාතයි.
- දකුණ, මධ්‍යම හා වයඹ පළාත්වල ද සැලකිය යුතු ජන සංඛ්‍යාවක් ජීවත් වේ.





4.3 ප්‍රස්තාරය - පළාත් අනුව ජනසංඛ්‍යා ව්‍යාප්තිය

- ජන සංඛ්‍යාව වැඩිම දිස්ත්‍රික්කය කොළඹ දිස්ත්‍රික්කයයි.
- ලංකාවේ ප්‍රධානතම වාණිජ හා පරිපාලන කටයුතු, අධ්‍යාපන කටයුතු හා සේවා ඒකරාශී වී තිබීම මීට හේතුවයි.
- ගම්පහ දිස්ත්‍රික්කයේ ද ජනගහනය අධික වේ.
- ඊට හේතු වී ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක හා බියගම නිදහස් වෙළෙඳ කලාප පිහිටා තිබීම නිසා ජන සංක්‍රමණ වැඩි වීමත්, කොළඹට ළඟා වීම පහසු වීමත් ය.
- මීට අමතරව කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර, ගාල්ල යන දිස්ත්‍රික්කවල ද වැඩි ජන සංඛ්‍යාවක් ඒකරාශී වී තිබේ.
- මෙම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාව මිලියනය ඉක්මවා තිබේ.
- මුලතිව් දිස්ත්‍රික්කය ජන සංඛ්‍යාව අඩුම දිස්ත්‍රික්කයයි.
- ප්‍රදේශයේ පවතින කටුක දේශගුණ තත්ත්වය, යටිතල පහසුකම් නොතිබීම, රැකියා අවස්ථා නොතිබීම වැනි කරුණු ජන සංඛ්‍යාව අඩු වීමට හේතු වී තිබේ.
- ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය ගත් විට ග්‍රාමීය ජන සංඛ්‍යාව වැඩි අතර නාගරික ජන සංඛ්‍යාව දෙවන තැන ද වතු ජන සංඛ්‍යාව තුන්වන තැන ද ගෙන තිබේ.




4.1 සිතියම - ශ්‍රී ලංකාවේ ජනඝනත්වය - 2012




4.4 ප්‍රස්තාරය - නාගරික, ග්‍රාමීය සහ වතු වශයෙන් ජනසංඛ්‍යා ව්‍යාප්තිය

# ජන සංයුතිය




4.5 ප්‍රස්තාරය - වාර්ගික ජනසංයුතිය, 2012




4.6 ප්‍රස්තාරය - ආගම් අනුව ජනසංඛ්‍යාව, 2012

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත, 2013.

# ජන සංඛ්‍යා ව්‍යුහය

ජනසංඛ්‍යාවක් උපතින් ම උරුම කර ගන්නා වයස් ව්‍යුහය සහ පුමිතිරි බව වැනි ලක්ෂණ ජනසංඛ්‍යාවක ව්‍යුහාත්මක ලක්ෂණ ලෙස හැඳින්වේ. 2012 ජන සංගණන වාර්තා අනුව ශ්‍රී ලංකාවේ වයස් ව්‍යුහය සහ පුමිතිරි බව අනුව ජනසංඛ්‍යාව පහත දැක්වේ.


| වයස් කාණ්ඩ අනුව ජනසංඛ්‍යාව | |
|---|---|
| වයස අවුරුදු 15ට අඩු | 25.8% |
| වයස අවුරුදු 15-59 | 62.0% |
| වයස අවුරුදු 60ට වැඩි | 12.2% |

| පුමිතිරි බව අනුව ජනසංඛ්‍යාව | |
|---|---|
| පුරුෂ | 48.5% |
| ස්ත්‍රී | 51.5% |

# ජන සංඛ්‍යා ව්‍යුහයේ සුවිශේෂී ලක්ෂණ

- වයස් ව්‍යුහය අනුව බාල වයස් කාණ්ඩවලට අයත් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වෙමින් පැවතීම.
- වියපත් කාණ්ඩවල සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීම.
- එනම් ජනතාව වියපත් වීමේ ගැටලුවට මුහුණ දී තිබීමයි.
- වයස අවු.59 ට වැඩි වැඩිමහල් යැපෙන්නන්ගේ සංඛ්‍යාව වැඩි වීම ජන සංඛ්‍යාව වියපත් වීම ලෙස හැඳින් වේ.
- මීට හේතුව උපත් අනුපාතිකය ක්‍රමයෙන් අඩු වීමත් ආයු අපේක්ෂාව ඉහළ යාමත් ය.
- මෙහි අහිතකර ප්‍රතිඵලය වන්නේ ශ්‍රම බලකාය ක්‍රමයෙන් අඩු වීමයි.
- ජන සංඛ්‍යාව තුළ ස්ත්‍රීන් හිමි කර ගෙන ඇති ප්‍රතිශතය ද වැඩි වෙමින් පවතී.

# ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම නිසා ඇති විය ගැටලු


Shanty housing in the Kettarama Colony, Colombo










# ක්‍රියාකාරකම

1. ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය වැඩි ම සහ අඩු ම දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් නම් කරන්න.
2. ජන සංඛ්‍යාව වැඩිම දිස්ත්‍රික්ක තුන සහ අඩුම දිස්ත්‍රික්ක තුන ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කරන්න. (වැඩිම දිස්ත්‍රික්ක රතු පැහැයෙනුත් අඩුම දිස්ත්‍රික්ක කහ පැහැයෙනුත් සේයා කරන්න.
3. ජන සංඛ්‍යාවේ අසමාන ව්‍යාප්තියට හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.
4. ජන සංඛ්‍යා ව්‍යාප්තියේ අසමානතා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.
5. ගම්පහ දිස්ත්‍රික්කය තුළ ජන සංඛ්‍යාව වැඩි වීමට හේතු පැහැදිලි කරන්න.
6. ජන සංඛ්‍යාව වියපත් වීමේ ගැටලුවට මුහුණ දීම නිසා රටට ඇති වන ගැටලු කෙටියෙන් විස්තර කරන්න.
7. ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම නිසා ඇති විය හැකි ගැටලු මොනවා දැයි සාකච්ඡා කරන්න.
8. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ අනාගතය කෙබඳු වේ දැයි වර්තමාන තත්ත්වය අනුව විමර්ශනයක් කරන්න.